**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2004**

මගේ අංකය: ආ/III/2/3-3
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2004.02.27

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්**
**පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්.**

**2004 පාර්ලිමේන්තු මැතිවරණය සහ වයඹ පළාත් සභා**
**<u>ඡන්ද විමසීම පැවැත්වීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය</u>**

2004 අප්‍රියෙල් 02 වන දින පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණය සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට සහ තේරීම් භාර නිලධාරීන්ට, පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් ද ඇතුළුව සමස්ත රාජ්‍ය සේවයේම නිලධාරීන්ගේ සහාය අත්‍යවශ්‍ය වේ. මැතිවරණ රාජකාරී සඳහා හඳුනා ගනු ලබන නිලධාරීන් පමණක් නොව සෙසු සියළුම නිලධාරීන් ද අවශ්‍යතාවයක් පැන නැගුණහොත් සේවයේ යෙදීම සඳහා සූදනමින් සිටිය යුතුය.

02. 2004 අප්‍රියෙල් මස අගදී පැවැත්වෙන වයඹ පළාත් සභා ජන්ද විමසීම් රාජකාරි සඳහා හඳුනාගනු ලබන නිලධාරීන් ද සේවයේ යෙදීම සඳහා සූදනම්ව සිටිය යුතුය.

03. එබැවින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගතයුතුව ඇත.

(අ) 2004.03.08 සිට 2004.04.06 දක්වා කාලය තුල රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට නිවාඩු අනුමත නොකල යුතු අතර, මෙම කාලය සඳහා දැනටමත් නිවාඩු අනුමත කර ඇත්නම් එම නිවාඩු අවලංගු කර ඇති සේ සැලකිය යුතුය. නිලධාරියෙකු රෝගාතුර වීම වැනි අතිශයින්ම විශේෂ වූ කරුණක් සම්බන්ධයෙන් නිවාඩු ලබාදීම පිළිබඳව පෞද්ගලිකව අදල අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් තීරණයක් ලබා දිය යුතුය.


(ආ) වයඹ පළාත් සභා ජන්ද විමසීම් රාජකාරි සඳහා හඳුනා ගනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් ඉහත සඳහන් සීමා කිරීම 2004.04.30 දක්වා බල පැවැත්වේ.

(ඇ) විදේශ දූත මණ්ඩල සමග නිල සාකච්ජා පැවැත්වීම, සම්මන්ත්‍රණ සම්මේලන හා පුහුණු වැඩ සටහන් ආදිය සංවිධානය කිරීමේදී ඉහත සඳහන් කාලය තුල නිලධාරීන් මැතිවරණ රාජකාරි සඳහා යොදවා ගැනීමට බාධාවක් නොවන අන්දමින් ඒවා සංවිධානය කිරීමට සියළුම අමාත්‍යාංශ හා පළාත් සභා විසින් කටයුතු කලයුතු වේ.

(ඈ) කිසියම් අති විශේෂ පෞද්ගලික අවශ්‍යතාවක් මත දිනයක් හෝ දෙකක් වැනි කෙටි කාලසීමාවකට නිවාඩු අවශ්‍ය වන්නේ නම් මැතිවරණ පත්වීම් ලිපි භාර ගැනීමට, තැපෑලෙන් ජන්දය ප්‍රකාශ කිරීමට හා උපදෙස් පන්තිවලට සහභාගිවීමට බාධාවක් නොවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි නිවාඩු අනුමත කල හැක.

(ඉ) 2004.03.08 සිට 2004.04.30 දක්වා කාලය තුල රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීම් අත්හිටුවිය යුතු වේ.

04. මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ මැතිවරණ කොමසාරිස්ගේ අදහස් විමසීමෙන් පසුවය.



**එස්.සී.මාන්නප්පෙරුම**
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය